{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
**Department of Education – North Central Province**

| 07 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය 2යි |
|---|---|---|

විෂයය :- නර්තනය (පහතරට)

පාසලේ නම :- ..........

ඇතුළත්වීමේ අංකය :- ..........

I පත්‍රය

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**අංක 1- 5 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න .**

1) “තෙයි කිට තෙයි කිට තෙයි තෙයි කිට තෙයි දොම්” යන පා සරඹ පදයට අයත් නාමය,

i. තුන්වන. ii. හතරවන. iii.පස්වන . iv.හයවන පා සරඹ පදය නම් වේ.

2) ආධුනික නර්තන ශිල්පියෙකු බෙර වාදනයට අනුව පළමුව .......... අභ්‍යාස කරනු ලබයි .

` i. පා සරඹ ii. ඉලංගම් සරඹ iii.දණ්ඩියමේ සරඹ iv.මණ්ඩි පද

3) වීර රසය උපදින්නේ.......... නමැති ස්ථායි භාවය මුල්කරගෙනය .

i. ශම ii. විශ්මය iii. ශෝකය iv. උත්සාහය

4) දෙවියන්ගේ පිහිට ලබා ගැනීමේ අරමුණින් බොහෝ ශාන්ති කර්මවල .......... කවි ගායනා කරනු ලබයි.

i. මල් යහන් ii. ගොයම් iii.පතුරු iv.කුලු

5) කතරගම දේවාල පෙරහැරේ ගෙන යන ඇතු වස්ත්‍රාභරණවලින් සැරසීම.......... චාරිත්‍රය නමින් හඳුන්වයි.

i. කප් සිටුවීම ii. වත බැඳීම iii.රංගවස්ත්‍ර ඇන්ඳවීම iv.විදුලි බුබුළු පැළඳවීමේ.

6) අංක 6 සිට 10 දක්වා ඇති A කොටස ප්‍රශ්න සඳහා පිළිතුරු B කොටසින් නිවැරදිව තෝරා යා කරන්න .

| | A | B |
|---|---|---|
| 6. | රෙගුඳ ගතකු දොම් | කුල්ල |
| 7. | කතරගම දේවාලයේ චාරිත්‍රයකි | නම්‍යතා අභ්‍යාස |
| 8. | ශරීරික ප්‍රසන්න බව ඇතිවීමට | කටු ගැසීම |
| 9. | ස්වභාවික පරිසරය දක්නට ලැබෙන සම්පතකි | ඉලංගම් සරඹ |
| 10. | කෘෂි කාර්මික සමාජයේ අත්‍යාවශ්‍ය උපකරණයකි | පා සරඹ |
| | | වැස්ස |

අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර පහත වරහන් තුලින් තෝරා හිස්තැනෙහි ලියන්න .

(කරගම්, , හනුමන්තා තාලයේ සින්දු වන්නම, භාවාදි තාලයේ සින්දු වන්නම ,මාත්‍රා තුනේ , මාත්‍රා හතරේ ,මඩු බැසීම, ගුරුවරම් දීම , උඩරට නර්තන කලාව )

11. “අගේ වඩන මගේ තාලම් හරඹ බලන්නේ” යන කවි පදය ............ තාල රූපයට ගායනා කළ හැකිය. ( )

12. සබරගමු නර්තන සම්ප්‍රදායේ කලඑළි මංගල්‍යය ............නමින් හඳුන්වයි. ( )

13. ජෙ. ඊ. සේදරමන් මහතා විසින් රචිත කෘතියක් වන්නේ ................ය. ( )

14. “දිං ගදිත තම් දොංත - ගත ගහිති ගතම් තත් තත්” යන්න ..............වන්නමේ ඉරට්ටියට අයත් පද කොටසකි. ( )

15. කලගෙඩි කිහිපයක් එක මත එක හිස මත තබා සමබර කර ගනිමින් .......... නම් ද්‍රවිඩ ගැමි නැටුම නටනු ලබයි.( )

**අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාල තොරතුරු හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( x ) ලකුණද ඉදිරියෙහි ඇති වරහන තුළ යොදන්න.**

16. පංච තූර්ය වර්ගීකරණයේ "විතතාතත" වර්ගයට දවුල අයත් වේ. ( )

17. නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ මූලික අංගහාරය "මණ්ඩියයි" ( )

18. තාලම් කවි සඳහා "රන් තෙළඹු වර්ණනාවේ" කවි යොදා ගනී . ( )

19. පහතරට සින්දු වන්නම් ආකෘතියෙහි කොටස් ගණන පහකි. ( )

20. "වීරත්වය" නිරූපණය කර පෙන්වීමට කඹ ඇදීමේ ක්‍රීඩාව යොදාගත හැකි ක්‍රියාකාරකමකි. ( )

**

II පත්‍රය

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න

1) i. ඔබ උගත් දෙතිතේ ප්‍රභේද දෙකක් නම් කරන්න. (ල .2)

ii. පහතරට හනුමන්තා කාලයේ සින්දු වන්නමේ ඉරට්ටිය ලියන්න. ( ල.3)

iii. " ඇත සිටන් එන්නේ සෙල්ලි සෙල්ලියේ '' යන කවි පදය අදාළ තාල රූපයට ප්‍රස්තාර කරන්න. (ල 3)

2) දෙවොල්මඩු ශාන්තිකර්මයට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න.

| | |
|---|---|
| ප්‍රචලිත ප්‍රදේශයක්<br>1…………………..……….. | පැවැත්වීමේ අරමුණක්<br>2…………………………………… |
| පුද ලබන දෙවි කෙනෙක්<br>3…………………..……….. | දිවි දෝෂය වැළඳුනු රජතුමා<br>4…………………………………… |
| පූර්ව චාරිත්‍රයක්<br>5…………………..……….. | ප්‍රධාන ඇඳුම් කට්ටලය<br>6…………………………………… |
| ප්‍රධාන වාද්‍ය භාණ්ඩය<br>7…………………..……….. | නර්තන අංගයක්<br>8…………………………………… |

3) i. කතරගම දේවාල පෙරහැර පැවැත්වීමේ අරමුණු දෙකක් ලියා දක්වන්න. (ල .2)

ii.කතරගම දේවාලයේ සාම්ප්‍රදායිකව වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන මංගල්‍යය තුන මොනවාද? (ල .3)

iii.කතරගම දේවාල පෙරහැරේ ගායන, වාදන,නර්තන අංග පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල .3)

4) පහත දැක්වෙන පින්තූරය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න




i. ඉහත දක්වා ඇති වාද්‍ය භාණ්ඩයෙහි නම කුමක්ද ? (ල .2)

ii.එම වාද්‍ය භාණ්ඩය අයත් නර්තන සම්ප්‍රදාය සහ

එම රූප සටහනේ දක්වා ඇති අංක 1 හා 2 කොටස් ලියා දක්වන්න (ල .3)

iii.අතීතයේ දී ඉහත වාද්‍ය භාණ්ඩය සන්නිවේදනය සඳහා යොදාගත් ආකාරය පිළිබඳව පැහැදිලි කරන්න(ල .3)

5) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. මඩු බැසීමේ මංගල්‍යය.
ii. ගොප්කොළ සැරසිලි
iii. රත්දැල්ලේ පොඩි මහත්තයා ගුරුතුමා
iv. රාමසාන් උත්සවයේ චාරිත්‍ර සහ පිළිවෙත් (ල 4 x 2)

6) අත්දැකීම් ඇසුරු කර ගනිමින් ප්‍රාසාංගික කලාංග නිර්මාණයන් බොහොමයක් බිහි වී ඇත.

i. “වෙසක් කැකුළු අතු අග ” ගීතයේ පද රචනය සහ ගීතය ගායනා කළ ශිල්පීන් නම් කරන්න. (ල 2)
ii. “අද වෙස්සන්තර රාජ පුතා ” ගීතයේ කොටස් දෙකක් ලියන්න. (ල 3)
iii. ඉහත ගීත දෙකෙන් ඔබ කැමති එක් ගීතයක් තෝරා ගෙන එහි පසුබිම පිළිබඳව විස්තර කරන්න. (ල 3)

7) i. සමූහ වාදනයක් සඳහා යොදා ගත හැකි තේමාවන් දෙකක් ලියන්න. (ල 2)

ii . සමූහ වාදනයකට යොදා ගත හැකි විකල්ප වාද්‍ය භාණ්ඩ දෙකක් නම්කර ඉන් එකක් චිත්‍රයට නගන්න. (ල 3)

iii.විකල්ප වාදන උපකරණයක් සකස් කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියා දක්වන්න. (ල 3)

***

සැකසුම:- අයිරංගනී ජයවර්ධන

අ/තඹුත්තේගම ම.ම.වි